5244

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ
සීමිත /විවෘත තරග විභාගය - 2011(2012)

## (01) අවබෝධය

(පැය දෙකයි)

ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **එකක්** තෝරාගෙන වාක්‍ය රචනයක් ලියන්න.

(i) ඛනිජ තෙල් අර්බුදය මගින් ශ්‍රී ලංකාවේ පොදු ජනතාව කෙරෙහි ඇතිවන බලපෑම
(ii) ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද වාතාවරණය සහ ආර්ථික සංවර්ධනයේ නව උපාය මාර්ග
(iii) මානව හිමිකම් උල්ලංඝනය නිසා මතුවන ගැටලු විසඳීම සඳහා ලෝක බලවතුන්ගේ මැදිහත්වීම
(iv) ශ්‍රී ලංකාවේ මිනිස් ඝාතන සහ ළමා අපයෝජන මගින් දෙදරා යන පාරම්පරික සාරධර්ම
(v) ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය හා දේශීය සංස්කෘතියේ අනන්‍යතාව සුරැකීම

*(ලකුණු 35 යි)*

**2.** පහත දැක්වෙන පාඨය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වන සේ සාරාංශයක් ලියන්න.

ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ ඒකාධිකාරියක් ලෙස පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ශ්‍රම වෙළඳපොළේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීමට නොහැකිවීමත්, පවතින ඉල්ලුමට සරිලන ලෙස සැපයීමට නොහැකිවීමත් යන කරුණු හේතුවෙන් ගැටලුවලට ලක්වී ඇත. පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කිරීම, අඩු ආදායම්ලාභී සිසුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා සීමාවීමක් ලෙස සලකා දශක ගණනාවක් තිස්සේ උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වයට බාධා ඇති විය. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකේය පොදු විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති අවස්ථා ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, වියදම් දැරීමට හැකි අය විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට යාම නිසා සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටතට ගලායාම සිදුවිය. මෙම වාතාවරණය තුළ උසස් අධ්‍යාපනය පෞද්ගලික අංශය වෙත විවෘත කරන බව රජය පැහැදිලිව ප්‍රකාශ කර ඇති අතර, එමගින් විදේශීය විශ්වවිද්‍යාලවලට අනුබද්ධ විශ්වවිද්‍යාල ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමට අවස්ථාව ලබාදෙනු ඇත. යෝග්‍ය නීතිරීති හා උපාධි පාඨමාලා තක්සේරු කර සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම මත පදනම්ව ප්‍රසිද්ධ විශ්වවිද්‍යාල ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීම මගින් මෙම විශ්වවිද්‍යාල වෙත විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමට ද හැකි වනු ඇත.

*(ලකුණු 25 යි)*

**3.** පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ක්ෂුද්‍ර මූල්‍ය අංශය ඉතුරුම් සංගම්, සීට්ටු ක්‍රම, ණය දෙන සමිති, මරණාධාර හා සුබසාධන සමිති ඇතුළු ඉතිරි කිරීමේ හා ණය දෙන සමිති සමාගම් යනාදී වෙනත් විවිධාකාර ආයතනවලින් සමන්විත වේ. "කුඩා ප්‍රමාණයේ ව්‍යවසායකයින්ට අතිරේක ඇප ආවරණ මත කෙටි කාලීන කාරක ප්‍රාග්ධනය සැපයීමේ ක්‍රමවේදයක් සහ දුප්පත්කම අඩුකර ගැනීමේ උපාය මාර්ගයක්" ලෙස ක්ෂුද්‍ර මූල්‍ය යන්න අර්ථ දක්වා ඇත. [Consultative Group to Assist the Poorest (CGAP) 2003] මෙම අංශයේ ක්‍රියාකාරකම් අනුව, අඩු ආදායම් උපයන සේවාලාභීන්ට, විශේෂයෙන් ම විධිමත් බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවලින් සාම්ප්‍රදායිකව නොසලකා හැර ඇති දිළිඳුකමින් පෙළෙන පුද්ගලයන් සඳහා ණය ලබා දීම, ඉතිරිකිරීම් ලබා ගැනීම, රක්ෂණ සේවා සැපයීම, මුදල් ප්‍රේෂණය ඇතුළු තවත් විවිධාකාර වූ මූල්‍ය සේවා (උපදේශක සහ තාක්ෂණ සේවා) සැපයේ. මේ අනුව, ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවලින් අපේක්ෂා කරනුයේ අඩු ආදායම්ලාභීන්ගේ හැකියාවන් සහ ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියා මාර්ග වැඩි දියුණු කිරීම සහ පුළුල් කිරීමයි. මෙහි දී වඩාත් ප්‍රචලිත ක්‍රමවේදය වනුයේ, අන්‍යෝන්‍ය ලෙස සහයෝගය දැක්වීමේ පදනම මත සංවිධානය වූ කණ්ඩායම් ක්‍රමය හරහා ණය පහසුකම් සැපයීමයි. ක්ෂුද්‍ර මූල්‍ය අංශය, ණය පහසුකම් සැපයීම මෙන්ම ණය ආපසු අයකර ගැනීම සඳහා ද මෙම කණ්ඩායම් ක්‍රමවේදය සාර්ථක ලෙස යොදා ගැනීමයි.

(i) ක්ෂුද්‍ර මූල්‍ය අංශය සමන්විත වන ආයතන කවරේ ද?
(ii) ක්ෂුද්‍ර මූල්‍ය කාර්යභාරය කවරේදැයි පහදන්න.

[ දෙවැනි පිටුව බලන්න.

(iii) ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල මූලික අරමුණ කුමක්දැයි දක්වන්න.

(iv) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, මූල්‍ය අතරමැදියන් සේ කටයුතු කරන්නේ කෙසේ ද?

(v) අඩු ආදායම්ලාභීන්ට සිය ජීවන තත්ත්වය උසස් කර ගැනීමට ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවලින් කෙරෙන මග පෙන්වීම කුමක් ද?

*(ලකුණු 15 යි)*

**4.** පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

2011 වසර තුළ දී, පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය පොල් වගා අංශයෙහි සංවර්ධන කටයුතු නොකඩවා ක්‍රියාවට නැංවීය. දකුණු පළාතෙන් මතු වූ පොල් වගාවට වැළඳෙන සුව කළ නොහැකි රෝගයක් වන "වැලිගම කොළ මැලවීමේ රෝගය" මගින් රටෙහි පොල් වගාව අනතුරට ලක්වී ඇත. මෙම රෝගයේ බලපෑමට ලක් වූ පොල් ගස් 18,109 ක් වසර තුළ දී කපා ඉවත් කළ අතර රෝගවලට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද හඳුන්වා දීමේ පළමු පියවර ලෙස මෙම රෝගයේ බලපෑමට ලක් වූ ප්‍රදේශයන්ට පොල් පැළ බෙදා දීම සිදු කෙරුණි. කටුපොල් (Oil Palm) වගා කරන වතු වැවිලි සමාගම් සඳහා අනුබලයක් ලෙස පොල් පර්යේෂණ ආයතනය තුළ කටුපොල් පර්යේෂණ කටයුතු සඳහා නව අංශයක් ස්ථාපිත කරන ලදී. මෙමගින් පිසීමට ගන්නා තෙල් සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම අතර පරතරය පියවීම සඳහා දේශීය වශයෙන් කටුපොල් වගා කිරීම දිරිමත් කෙරේ. පොල් වගා සහන වැඩ පිළිවෙළ සඳහා සුදුසුකම් ලැබීමට තිබිය යුතු අවම භූමි ප්‍රමාණය අක්කර බාගයේ සිට අක්කර කාල දක්වා අඩු කරන ලදී. එමෙන්ම, උතුරු සහ නැගෙනහිර දෙපළාතෙහි හඳුනාගත් අක්කර 70,000 ක පමණ පොල් වගා කටයුතු වර්ධනය කිරීමේ අරමුණින් කිලිනොච්චි ප්‍රදේශයෙහි බීජ පැළ තවානක් පිහිටුවීම සඳහා පියවර ගෙන ඇත. තව ද පොල් වගා ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සහතික කිරීම සඳහා රජය විසින් නව අමාත්‍යාංශයක් පිහිටුවන ලදී.

(i) වර්තමානයේ දී ලක්දිව පොල් වගා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන ආයතන කවරේ ද?

(ii) කටුපොල් වගාව ස්ථාපිත කිරීමට හේතු කවරේ ද?

(iii) මෑත භාගයේ දී නව පොල් ප්‍රභේද හඳුන්වා දීමට ආසන්නතම හේතුව කුමක් ද?

(iv) පොල් වගාවෙහි ශීඝ්‍ර සංවර්ධනයක් අපේක්ෂිත කලාප **දෙකක්** නම් කරන්න.

(v) පොල් වගාව දිරිමත් කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න.

*(ලකුණු 15 යි)*

**5.** පහත දැක්වෙන පාඨයේ සාරය **එක්** වාක්‍යයකින් ලියන්න.

අද බොහෝ රටවල් ඔවුන්ගේ කර්මාන්ත අංශය වැඩිදියුණු කිරීම සඳහා නවීන පන්නයේ නිෂ්පාදිත අඩු පිරිවැයකින් නිපදවීමට නැනෝ තාක්ෂණය භාවිත කරයි. උදාහරණයක් ලෙස සාමාන්‍ය රෙදිපිළි, නැනෝ තාක්ෂණය යොදා ගනිමින් දියර සහ වෙනත් ද්‍රව්‍ය උරා නොගන්නා රෙදිපිළි බවට සකස් කිරීමට හැකි වන අතර, මේ නිසා පැල්ලම් සහ ඉහිරීම්වලින් බලපෑමක් නොවන විශේෂ ගුණයක් මෙම රෙදිපිළිවලට ලැබේ. එමෙන්ම, නෙළුම් මලේ දැකිය හැකි ජලය නොරැඳෙන විශේෂ ගුණාංගය, නැනෝ තාක්ෂණය යොදා ගනිමින් තීන්තවල ඇති කිරීමෙන් තීන්ත ආලේප කරන බිත්ති දූවිලි සහ ජලය එකතු නොවී දිගු කලක් මුළුල්ලේ පිරිසිදුව තබා ගැනීමට හැකි වී තිබේ. තව ද ඉතා උස ගොඩනැගිලිවල වීදුරු ජනේල පිරිසිදු කිරීමේ අපහසුතාවට විසඳුමක් වශයෙන් නැනෝ තාක්ෂණය භාවිත කොට දූවිලි සහ වෙනත් සියුම් අපද්‍රව්‍ය නොරැඳී ඉබේම පිරිසිදු වන වීදුරු වර්ගයක් නිෂ්පාදනය කර ඇත. මේවා කර්මාන්ත අංශයේ නැනෝ තාක්ෂණය යොදා ගන්නා ආකාරය දැක්වෙන උදාහරණ කිහිපයකි.

*(ලකුණු 10 යි)*

* * *